**Abstract No: HSS 48** **Humanities and Social Sciences**

# ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය තුළ වැඩිහිටියන් මුහුණ දෙන සමාජ-ආර්ථික ගැටලු හා අභියෝග

**හෙට්ටිආරච්චි පි. සී.[1*], අමරතුංග කේ. එම්. ජී.**

වයස්ගතවීම සාධක රැසක බලපෑමට නතු වු බහුමානීය සමාජ සංසිද්ධියක් වශයෙන් හඳුනාගත හැකියග සංවර්ධිත රටවල වයස අවු;65 සහ ඊට වැඩි අයත්ල සංවර්ධනය වෙමින් පවත්නා රටවල වයස අවු;60 සහ ඊට වැඩි පිරිසත් වයස්ගත ජනගහනය වශයෙන් සැළකේග ආසියානු කලාපයේ වේගවත් වියපත්වීමක් සහිත ජන සංඛ්‍යාවක් ඇති සමාජයක් වශයෙන් ශ්‍රී ලංකාවේල වයස අවුරුදු 60ට වැඩි මුළු ජනගහනය 2030 වන විට 22 ක් වන බවට ප්‍රක්ෂේපනය කර ඇත. ලාංකේය සමාජයේ වයස්ගත ජනගහනයේ වර්ධනයට සාපෙක්ෂවල සමාජ-ආර්ථික වර්ධනයක් සිදු නොවීමල වැඩිහිටියන් බහුතරයකගේ ජීවිකාව තුළ විවිධ ගැටලු නිර්මාණයට හේතුවක් වී තිබේග වත්මන් ආර්ථික අර්බුදය (Current Economic Crisis), මේ තත්ත්වය වඩාත් තීව්‍ර වීමට හේතුවක් වී තිබෙන අතරල වැඩිහිටියන් බහුතරයක් සමාජ-ආර්ථික (Socio-Economis) වශයෙන් විවිධ අභියෝගයන්ට මුහුණදෙමින් සිය ජීවිකාව ගතකරනු ලබන තත්ත්වයකි. මෙහි පර්යේෂණ ගැටලුව වත්මන් ආර්ථික අර්බුදය හමුවේ වැඩිහිටියන්ට මුහුණ දීමට සිදු වී ඇති සමාජ-ආර්ථික ගැටලු හා අභියෝග ගවේෂණය කර ගැනීමයි. පර්යේෂණ අරමුණ වනුයේ වැඩිහිටි ජීවිකාව කෙරෙහි බලපෑමක් වී ඇති සමාජ-ආර්ථික ගැටලු හා අභියෝග ගවේෂණය කර ගනිමින්ල තිරසර වැඩිහිටි දිවියක් නිර්මාණය කරගැනීමට අවැසි නව ප්‍රවේශයන් හා ක්‍රමොපායන් හඳුනාගැනීමයි. මෙහි පර්යේෂණ ක්‍රමවේදය මිශ්‍ර ක්‍රම පර්යේෂණ ක්‍රමවේදය වු අතරල සමීක්ෂණ ක්‍රමය භාවිතා වියග නියදිය වශයෙන් වැඩිහිටියන් 25කු සසම්භාවී (ස්තර නියදි තේරීම) යටතේ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළින් තෝරා ගන්නා ලදී. දත්ත රැස්කිරීමේ දී ප්‍රමාණාත්මක දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්ණාවලිය (Questionnaire), සම්මුඛ සාකච්ඡාව (Interview), යොදාගනු ලැබු අතරල ගුණාත්මක දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම වශයෙන් නාභිගත කණ්ඩායම් සම්මුඛ සාකච්ඡාව (Focus Group Discussion), හා ප්‍රත්‍යෙයික අධ්‍යයන (Case study), නිරීක්ෂණය (Observation) උපයෝගී කරගන්නා ලදීග පර්යේෂණ ගැටලුව සම්බන්ධයෙන් ලිය වී ඇති ද්වීතික මුලාශ්‍ර (Secondary Sources) ආශ්‍රයෙන් ද්විතීක දත්ත රැස්කරණු ලැබීයග දත්ත ප්‍රමාණාත්මක හා ගුණාත්මකව විශ්ලේශණය සිදුකරන ලදී. පර්යේෂණ අනාවරණයන්ට අනුව පැහැදිලි වන්නේ වත්මන් ආර්ථික අර්බුදයල වැඩිහිටියන් බහුතරයකගේ ජිවිකාව තුළ සුවිශේෂී සමාජ-ආර්ථික ගැටලු නිර්මාණය වීමට හේතුවක් වී ඇති බවයි. වත්මන් ආර්ථික අර්බුදය විසින් නිර්මාණය කර ඇති මානව ජන ජීවිතයේ සංකිර්ණත්වයල වැඩිහිටියන්ගේ රැකවරණය විෂයෙහි සෘජු බලපෑමක් වී තිබෙන අතරල පවුල තුළ වැඩිහිටියන් තවදුරටත් හුදෙකලා කිරීමට හේතු වී තිබේග පවුල් සංස්ථාවේ සමාජිකයින්ගේ ජීවිත සංකීර්ණවීම තුළල රැකවරණය අවැසි වැඩිහිටියන් කෙරෙහි දරුවන්ගේ සංවේදීතාවය අඩුවීමටත්ල විශේෂයෙන් වයස අවු:80ට වැඩි මහලුතම වැඩිහිටියන්ගේ ජීවන සුරක්ෂිතතාවය හා රැකවරණය, පෝෂණය විෂයෙහි අභියෝග මතුකිරීමටත් හේතුවක් වී තිබෙනු හඳූනාගත හැකි විණග ආර්ථික දුෂ්කරතාවයන් හේතුවෙන් පවුල් සංස්ථාව තුළ දරුවන් හා දෙමාපියන් අතර ඇති වී ඇති ගැටලු හේතුවෙන් පවුලේ සහයක පද්ධතිය විෂයෙහි ද (Family support System) බලපෑමක් වී තිබුණිග නියදිය තුළ වැඩිහිටියන් අතුරින් (68%) අවධිමත් ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුතු අයවලුන් වශයෙන් පවත්නා තත්ත්වය තුළ සිය ජීවන මාර්ගයන් වෙත ප්‍රවේශවීමට නොහැකිවීමල දැඩි ආර්ථික දුෂ්කරතාවයන් ඇතිවීමට හේතුවක් වී තිබු අතරල එහි සෘජු හා වක්‍ර ප්‍රතිඵලය වී තිබුණේ කුටුම්භයේ පෝෂණය තත්ත්වයල කෘත්‍යයන් හා සමාජ අවස්ථා පවත්වාගෙන යෑමටත් වැඩිහිටියන්ට බලපෑමක් වී තිබීමයිග නියදිය තුළ වැඩිහිටියන් අතුරින් (76%) නිදන්ගත අබාධයන් සඳහා ප්‍රතිකාර ගන්නා අය වශයෙන්ල ආර්ථික අර්බුදය තුළ සෞඛ්‍යමය වශයෙන් ද අභියෝගයන්ට මුහුණ දී ඇතග පර්යේෂණ අනාවරණයන්ට අනුව තවදුරටත් පෙනීගියේ ගෘහ කුටුම්භය තුළ ජීවත්වන වැඩිහිටි පුරුෂයන්ට සාපේක්ෂව වැන්දඹු වැඩිහිටි ස්ත්‍රීන් වැඩි වශයෙන් පවත්නා තත්ත්වය හමුවේ සමාජ-ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණ දී සිටින බවයිග නිවාස තුළ පවත්නා මුලික අවශ්‍යතාවයන්ල භෞතික හා සනීපාරක්ෂක පහසුකම් හිඟතාවයල වැඩිහිටි ස්ත්‍රීන්ගේ ජීවන ගැටලු තවත් තීව්‍ර කිරීමටත් හා ඔවුන්ගේ යැපුම් මානසිකත්වය වර්ධනය වීමටත් හේතුවක් වී තිබෙනු හඳුනාගත හැකිවිණ.

**මුඛ්‍ය පද :** වැඩිහිටියා, ආර්ථික අර්බුදය, පවුල, ජීවිකාව, රැකවරණය

[1] NISD, Sri Lanka
* hettipriya250@gmail.com